

# ගුරු විභාග සාමාන්‍ය දැනීම 1000

සම්පාදනය - මධ්‍යම පළාත් උපාධි ගුරු විභාගය 2017 ප්‍රථම ස්ථානය (සාමාන්‍ය දැනීම ලකුණු 92.5) ලැබූ A.R. අමරසිංහ විසිනි.

පොතේ විශිෂ්ඨත්වය ප්‍රායෝගිකව තහවුරු කර ඇත...

- ✯ උපාධි ගුරු විභාග සඳහා සම්පාදිත එකම හා මුල්ම ගුරු අධ්‍යාපන සාමාන්‍ය දැනුම පොත.
- ✯ සම්පූර්ණ ගුරු ක්ෂේත්‍රය ආවරණය කරමින් අධ්‍යාපන සාමාන්‍ය දැනීම කරුණු 1000 කින් සමන්විතයි.
- ✯ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ඇසුරින් සකසා ඇත.
- ✯ නවතම කරුණු වලින් යාවත්කාලීනයි. (2017 අප්‍රේල් දක්වා)

උපාධි ගුරු තරඟ විභාග සඳහා

# ගුරු විභාග සාමාන්‍ය දැනීම 1000

- උපාධි ගුරු විභාග සඳහා සම්පාදිත එකම හා මුල්ම ගුරු අධ්‍යාපන සාමාන්‍ය දැනුම පොත.

- සම්පූර්ණ ගුරු ක්ෂේත්‍රය ආවරණය කරමින් අධ්‍යාපන සාමාන්‍ය දැනීම කරුණු 1000 කින් සමන්විතයි.

- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ඇසුරින් සකසා ඇත.

- නවතම කරුණු වලින් යාවත්කාලිනය (2017 අප්‍රේල් දක්වා).

**A.R. අමරසිංහ**

# ඔබගේ අවධානයට...

ජාතික පාසල් උපාධි ගුරු විභාගය සහ පළාත්සභා උපාධි ගුරු විභාග සඳහා සාමාන්‍ය දැනීම ප්‍රශ්ණ පත්‍රයකට හා අභියෝගතාව ප්‍රශ්න පත්‍රයකට මුහුණදිය යුතුය.

එහි සාමාන්‍ය දැනීම ප්‍රශ්ණ පත්‍රය අළලා මෙම නිබන්ධය සකස් කර ඇත. එම ප්‍රශ්ණ පත්‍රය පැයක් තුළ පිළිතුරු ලිවිය යුතු බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්ණවලින් සකස් වෙයි. එහි විෂය නිර්දේශය, "ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳ ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදුවී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම" - (උපුටා ගැනීම ගැසට් පත්‍රය) වේ. මෙම නිබන්ධයෙහි **එම ක්ෂේත්‍රයන් සම්පුර්ණයෙන් ආවරණය කරමින්** කරුණු දක්වා ඇත.

ගුරු ක්ෂේත්‍රයේ අධ්‍යාපන සාමාන්‍ය දැනීමට අදාළ ග්‍රන්ථයක් ප්‍රකාශ ව නොමැති අතර මෙම නිබන්ධය විභාග ජයග්‍රහණය සඳහා මනා අත්වැලක් සපයයි.

මාස ගණනක විභාග උපකාර පන්තිවලට සහභාගි වී ලබාගතයුතු දැනුමක් මෙයින් ඔබට ලබාගත හැක.

ඔබට විශිෂ්ඨ ජයක් පතමි!

1. ශ්‍රී ලංකාවේ පළමු අධ්‍යාපන ආයතනය - **මහාවිහාරය.**

2. අතීතයේ විශ්ව විද්‍යාලයක් ලෙස භාවිතා වූ, පොළොන්නරුවේ ඓතිහාසික පිරිවෙන - **ආලාහන පිරිවෙන.**

3. ශ්‍රී ලංකාවේ පැරණි දේශිය අධ්‍යාපන ක්‍රමය යටතේ අධ්‍යාපනය ලබාදුන් ආයතන - **ගුරුගෙදර, පන්සල, පිරිවෙන.**

4. මහාවිහාරය හා අභයගිරිය හැරුණු විට අනුරාධපුර යුගයේ ප්‍රසිදධ වූ අනෙක් අධ්‍යාපන ආයතනය - **ජේතවනාරාමය**

5. ලංකාවේ මුල්ම විධිමත් අධ්‍යාපන ක්‍රමය ලෙස හඳුන්වන්නේ - **පිරිවෙන**

6. කෝට්ටේ යුගයේ මෙරට ප්‍රසිද්ධව තිබූ පිරිවෙන් - **තොටගමුවේ විජයබා, පැපිලියානේ සුනේත්‍රාදේවි, කැරගල පද්මාවතී පිරිවෙන්**

7. මිෂනාරි අධ්‍යාපන ක්‍රමය ලංකාවට හඳුන්වාදුන්නේ - **පෘතුගීසීන්**

8. පෘතුගීසීන් මිෂනාරි අධ්‍යාපන ක්‍රමය හඳුන්වාදීමේ මූලික අරමුණ - **ආගම ප්‍රචාරණය**

9. පෘතුගීසි යුගයේ මෙරට ක්‍රියාත්මක වූ මිෂනාරි නිකායන් - **ජෙසුයිස්ට්, ප්‍රැන්සිස්කන්, ඔගස්ටීනියන්, ඩොමිනිකස්**

10. ලන්දේසීන් මෙරට ක්‍රියාත්මක කළ අධ්‍යාපන ක්‍රමය - **මිෂනාරි අධ්‍යාපන ක්‍රමය**

11. ලන්දේසීන් මෙරට ඇරඹූ පාසල් වර්ගය - **පැරිස් පාසල්**

12. ලන්දේසී පාසල් පරිපාලනයේ ප්‍රධාන මූලස්ථානය හැඳින්වූයේ - **පාසල් මඬුල්ල**

13. පැරිස් පාසල්වල මුල් ගුරුවරයා හැඳින්වූයේ - **රාළාහාමි / පල්ලියේ ගුරුන්නාන්සේ**

14. ලන්දේසී ඉගැවීමේ ක්‍රමය ලෙස භාවිතා කළේ - **ප්‍රශ්නොත්තර ක්‍රමය**

15. ලන්දේසී පාලන සමයේ ඇරඹි අනත්දරු පාසල් වර්ගය - **විස්කමීර්**

16. ලන්දේසී පාලන සමයේ දිළිඳු දරුවන් සඳහා ඇරඹි පාසල් වර්ගය - **අරමෙන් හයිස්**

17. ලන්දේසී පාලන සමයේ අධ්‍යාපන කටයුතු අධීක්ෂණය සඳහා පැවැති ආයතනය - **ස්කොලාකල් කොමිසම**

18. ලන්දේසී පාලන සමයේ ගුරු පුහුණුව ලබාදුන් ආයතනය - **සෙමනේරිය**

19. ලන්දේසි පාලන සමයේ අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව - **පිරිමි අවුරුදු 15, ගැහැණු අවුරුදු 10**

20. ලන්දේසි පාලන සමයේ ස්කොලාකල් කොමිසමේ සභාපතිවුයේ - **දිසාවේවරයා**

21. කොළඹ ඇකඩමිය ඇරඹීමට පුරෝගාමී වූ ආණ්ඩුකාරවරයා - **ෆෙඩ්‍රික් නොර්ත්**

22. 1834 දී පිහිට වූ මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් කොමිසම - **පාසල් කොමිසම**

23. 1834 පාසල් කොමිසම පිහිටුවීමට නිර්දේශ කළේ - **කෝල්බෘක් කොමිසම**

24. 1833 කෝල්බෘක් කොමිසමේ අධ්‍යාපනයට අදාළ යෝජනා -
    - **රටේ සියළුම පාසල් පරිපාලනයට 'පාසල් කොමිසම' පත් කළ යුතුය.**
    - **පාසල්වල ඉගැන්වීමේ මාධ්‍යය ලෙස ඉංග්‍රීසි අනිවාර්ය කළ යුතුය.**
    - **ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා විද්‍යාලයක් ඇරඹිය යුතුය.**
    - **මිෂනාරි පාසල් සඳහා රජය සහයෝගය හා ධෛර්යය දිය යුතුය.**
    - **මුද්‍රණාල සහ පුවත්පත් බහුල කළ යුතුය.**
    - **ඉංග්‍රීසි උගත් ලාංකිකයන් රජයේ රැකියාවලට බඳවාගත යුතුය.**

25. 1869 දී පිහිට වූ මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් ආයතනය - **ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව (Public department of instructions)**

26. 1869 දී ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටුවීමට නිර්දේශ කළේ - **මොර්ගන් කමිටුව**

27. 1867 මොර්ගන් කමිටු වාර්තාව සැකසුයේ - රිචර්ඩ් F. මෝර්ගන් (ශ්‍රී ලංකාවේ ප්‍රථම අධ්‍යාපන කමිටු වාර්තාව)

28. ෆෙඩ්‍රික් නොර්ත් සමයේ (1798-1805) දේශීය ප්‍රභූ පන්තියේ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමට ඇරඹි පාසල - **කොළඹ ඇකඩමිය**

29. බ්‍රිතාන්‍යය සමයේ මෙරට බෞද්ධ පාසල් ඇරඹීමේ පුරෝගාමියා - **හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා**

30. රටේ සියළුම පාසල් කොමිසමක පාලනය යටතට ගෙන ආ යුතු බව යෝජනා කළ කොමිසම - **කෝල්බෘක් කොමිසම**

31. ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කරමින්, ඉංග්‍රීසි මාධ්‍යය පාසල් ඇතිකළේ කුමන ප්‍රතිසංස්කරණ යටතේද? **1833 කෝල්බෘක් ප්‍රතිසංස්කරණ**

32. 'නෝර්මල් පාසල්' ඇරඹීමේ අරමුණ - **ගුරුවරුන් පුහුණු කිරීම**

33. බ්‍රිතාන්‍ය සමයේ මුල්කාලයේ මෙරට පාසල් අධ්‍යාපනය පවත්වාගෙන ගිය මිෂනාරි සමාගම්-
    - **ලන්ඩන් මිෂනාරි සමාගම (1805)**
    - **බැප්ටිස්ට් මිෂනාරි සමාගම (1812)**
    - **වෙස්ලියන් මිෂනාරි සමාගම (1814)**
    - **ඇමරිකන් මිෂනාරි සමාගම (1816)**

34. බ්‍රිතාන්‍ය සමයේ, 1869න් පසු යුගයේ මෙරට පැවැති පාසල් වර්ග -
    - **ඉංග්‍රීසි පාසල් - නාගරික ප්‍රදේශවල පිහිටි, ගාස්තු අයකළ පාසල්**
    - **ගම්බද පාසල් - මූලික අධ්‍යාපනය ලබාදීම අරමුණු කරගත් ගාස්තු අය නොකළ පාසල්**
    - **නේවාසික පාසල් - ආගමික අධ්‍යාපනය ලබාදීම අරමුණ වූ පාසල්**

35. 1796 දී බ්‍රිතාන්‍යයන් ලංකාවේ මුහුදුබඩ පළාත්වල පරිපාලනය පවරාගත් අවස්ථාවේ මෙරට ක්‍රියාත්මක වූ පාසල් පද්ධති 2 –
    - **පන්සල් ආශ්‍රිත පාසල් ක්‍රමය (උඩරට ප්‍රදේශවල)**
    - **පැරිස් (මීසම්) පාසල් (පහතරට ලංදේසි ප්‍රදේශවල)**

36. මද්රාස නම් මුස්ලිම් පාසල් ඇරඹියේ - **බ්‍රිතාන්‍ය පාලන සමයේ**

37. 1841 පිහිටවූ මෙරට අධ්‍යාපායට අදාළ කොමිසම - **මධ්‍යම පාඨශාලා කොමිසම**

38. 1867 R.F. මෝර්ගන් කමිටුවේ නිර්දේශ -
    - **මධ්‍යම පාඨශාලා කොමිසම අහෝසි කර, අධ්‍යාපන අධ්‍යක්ෂකවරයකු යටතේ ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටුවීම.**
    - **මූලික අධ්‍යාපනය ස්වභාෂා මාධ්‍යයෙන් ලබදීම (ද්විතීක අධ්‍යාපනය ඉංග්‍රීසියෙන්)**

39. ප්‍රසිද්ධ ඉගැන්විම් දෙපාර්තමේන්තුවේ ප්‍රථම අධ්‍යක්ෂවරයා - **ජේ.එස්. ලෝරි**

40. ෆෙඩ්‍රික් නොර්ත් සමයේ පැරිස් පාසල්වල ප්‍රධානියා (පාසල් භාර විදුහල්පති) ලෙස පත් කළේ - **ජේම්ස් කෝඩිනර් පූජකවරයා**

41. මෙරට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මුලාරම්භය ලෙස සැලකෙන්නේ - **1869 දී ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටුවීම**

42. 'ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ' නම 'අධ්‍යාපන දෙපාර්තමේන්තුව' ලෙස වෙනස්කර භාවිතා වූයේ - **1912**

43. ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවේ නම, අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස වෙනස් කළ කමිටුව - **මැක්ලියොඩ් කමිටුව**

44. 'ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ' නම 'අධ්‍යාපන දෙපාර්තමේන්තුව' ලෙසට නීතිගත කළේ - **1920**

45. අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය බවට පත්වූයේ - **1931**

46. නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වූයේ - **1945 ඔක්තෝබර් 01**

47. මෙරට හින්දු ආගමික අධ්‍යාපන ප්‍රබෝධයේ පුරෝගාමියා - **ආරුමුග නාවලර්**

48. මුදල් ගෙවීමට නොහැකි දරුවන්ට නොමිලේ අධ්‍යාපනය දුන් පාසල් - **පුණ්‍ය පාඨශාලා**

49. මොනිටර් ක්‍රමය යනු - **දක්ෂ ශිෂ්‍යයින් ලවා අනෙක් ශිෂ්‍යයින්ට ඉගැන්වීමේ ක්‍රමය**

50. මධ්‍ය මහා විදුහල් ඇරඹියේ - **සාමාන්‍ය පාසල්වල පැවැති අධ්‍යාපනයේ අඩුපාඩුවලට පිළියම් යෙදීමට**

51. 1842 - **ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණුව සඳහා, ඉංග්‍රීසි නෝමල් පාසල ඇරඹීම.**

52. 1845 - **සිංහල ගුරුවරුන් පුහුණුව සඳහා, සිංහල නෝමල් පාසල ඇරඹීම.**

53. 1916 - **දෙමළ මාධ්‍යය ගුරු විද්‍යාල ආරම්භය**

54. උපාධිධාරි ගුරුවරුන් පුහුණුව ඇරඹීමට යෝජනා කළේ - **1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටුව**

55. පෞද්ගලික පාසල් හා ගුරු විද්‍යාල රජයට පවරා ගැනුණේ - **1960 ආධාර ලබන පාසල් හා ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතින්**

56. මෙරට ආධාර ලබන මුස්ලිම් පාසල් නඟාසිටුවීමේ පුරෝගාමියා- **එම්.සී. සිද්දි ලෙබ්බේ**

57. මුස්ලිම් පාසල් නඟාසිටුවීම සඳහා සිද්දි ලෙබ්බේ මහතාට සහාය වූ විදේශිකයා - **ඔරබි පාෂා**

58. මෙරට බෞද්ධ අධ්‍යාපනයට විශාල මෙහෙවරක් කළ ඇමරිකානු ජාතික කත - **මාරි මියුසියස් හිගින්ස්**

59. මෙරට ප්‍රථම බෞද්ධ පාසල - **ජිනලබ්ධි විශෝදක පාසල 1869 (දොඩන්දූවේ පියරතන හිමි) වත්මන - දොඩන්දූවේ පියරතන මහ විද්‍යාලය**

60. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා උපන් දිනය - **1884 ඔක්තෝබර් 13**

61. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා පාසල් ගියේ - **රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල**

62. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ මුල්ම රැකියාව - **ගුරු වෘත්තිය**

63. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා වෘත්තියෙන් - **නීතිඥයෙක්**

64. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා ව්‍යවස්ථාදායක සභාවට තේරිපත් වුයේ - **1923**

65. ලංකාවේ පළමු අධ්‍යාපන අමාත්‍යවරයා - **සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා**

66. නිදහස් අධ්‍යාපනයේ පියා - **සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා**

67. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා අධ්‍යාපන අමාත්‍යධූරයට මුලින්ම පත්වුයේ - **1931 (රාජ්‍ය මන්ත්‍රණ සභාව - අධ්‍යාපනය පිළිබඳ විධායක කමිටු සභාපති)**

68. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා අධ්‍යාපන අමාත්‍යධූරය දැරූ කාලය - **1931 සිට 1947 දක්වා**

69. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ මුල් අකුරු වලින් හැඳින්වෙන නම - **ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන්**

70. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ දෙමාපියන් - **පියා දොන් ඩැනියෙල් විජේකෝන්, මව එමලි විජේකෝන්**

71. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා මියගිය වර්ෂය - **1969**

72. ලංකාවේ මුළු පාසල් සංඛ්‍යාව - **10,997 (නව මහබැංකු 2016 – 11,021)**

73. ශ්‍රී ලංකාවේ රජයේ පාසල් ගුරු ශිෂ්‍ය අනුපාතය - **1:18**

74. වර්ෂයකට පාසල් පැවැත්විය යුතු දින ගණන - **210**

75. 2016 වර්ෂයේ පාසල් පැවැත්වු, 2017 වර්ෂයේ පැවැත්වෙන දින ගණන - **197**

76. ලංකාවේ සමස්ත අධ්‍යාපන කලාප සංඛ්‍යාව - **98**

77. නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා - **ඊ.ඒ. නුගවෙල**

78. ප්‍රථම විභාග කොමසාරිස් - **එල්.එල්.කේ. ගුණතුංග (1951)**

79. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් - **ජයන්ති ගුණසේකර**

80. ලංකාවේ සාක්ෂරතාවය - **93.2%**

81. ලංකාවේ මුළු රාජ්‍ය විශ්වවිද්‍යාල (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ) ගණන - **15**

82. මෙරට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව - **19**

83. බන්ධනාගාරගත වුවන් සදහා ආරම්භ කළ මුල්ම පාසල - **හෝමාගම වටරැක බධනාගාරයේ සුනීත පාසල**

84. ජාතික අධ්‍යාපන කොමිසමේ වර්තමාන සභාපති - **මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක**

85. වෘත්තීය පුහුණුව සදහා පිහිටුවා ඇති විශ්වවිද්‍යාලය - **වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය (Univotec - රත්මලාන)**

86. අ.පො.ස. උසස් පෙළ විෂයයන් ගණන 4 සිට 3 දක්වා අඩුකළේ - **1998 (ප්‍රථමවරට විභාගය - 2000)**

87. ජාතික පාසල් අධ්‍යකෂක - **ජයන්ත වික්‍රමනායක**

88. පාසල් සංවර්ධන සමිතියේ අනුශාසකයා - **කලාප අධ්‍යාපන අධ්‍යකෂ හෝ ඔහු පත්කළ අයෙක්**

89. සිදත් සඟරාව ලියන ලද්දේ - **වෛදේහ හිමි**

90. 1990 තායිලන්තයේ, ජොම්ටියන් ලෝක අධ්‍යාපන සමුළුවෙන් සම්මත කළේ - **සැමට අධ්‍යාපනය පිළබඳ විශ්ව ප්‍රකාශනය**

91. ළමා ශ්‍රමය ලෙස ගැනෙන වයස් සීමාව - **අවුරුදු 14ට අඩු**

92. සමුපකාර අධ්‍යාපනය ලබාදෙන පාසල පිහිටියේ - **පොල්ගොල්ල**

93. අධ්‍යාපනය යනු දැනුම ඒකරාශි කිරිමේ වැඩපිලිවෙළයි - **ෆ්‍රැන්සිස් බේකන්**

94. ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කරමින්, ඉංග්‍රීසි මාධ්‍යය පාසල් ඇතිකළේ කුමන ප්‍රතිසංස්කරණ යටතේද? **1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ**

95. පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අයත් අමාත්‍යාංශය - **අධ්‍යාපන අමාත්‍යංශය**

96. මිශ්‍ර සිංහල හෝඩියේ ස්වර ගණන - **18**

97. ලංකා ද්‍රවිඩ සංගමය ඇරඹූ සුප්‍රකට සහෝදරයන් - **පොන්නම්බලම් අරුණාචලම, පොනම්බලම රාමනාදන්**

98. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය අරම්භ කිරීමට ආධාර දුන් රට - **ස්වීඩනය**

99. පාසල් නිල ඇඳුම ලෙස ශිෂ්‍යාවන් ළමාසාරි අදින උතුරුමැද පළාතේ පිහිටි පාසල - **කැකිරාව මධ්‍ය මහා විද්‍යාලය**

100. 2017 වසරේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රථම ස්ථානය - දිනුක් ක්‍රිෂාන් කුමාර, හරිස්චන්ද්‍ර විද්‍යාලය මීගමුව

*** පොත අධ්‍යාපන සාමාන්‍ය දැනීම කරුණු 1000 කින් සමන්විතයි.**

*** 2017 වෘත්තීය විෂය ජාතික හා පළාත් පාසල් ගුරු විභාගය,** බස්නාහිර පළාත් චිත්‍ර 2017 ගුරු විභාගය, ඇතුළු ගුරු විභාග **සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍ර විෂය නිර්දේශය මුළුමනින්ම ආවරණය කෙරේ.**

*** වැඩි විස්තර හා පොත මිලදී ගැනිම සඳහා මෙම වෙබ් අඩවියට පිවිසෙන්න.**

https://gklanka.wordpress.com/ගුරු විභාග සාමාන්‍ය දැනිම 1000 පොත/

*** සම්පාදනය A.R. අමරසිංහ, මධ්‍යම පළාත් උපාධි ගුරු විභාගයේ 2017 ප්‍රථම ස්ථානය (සාමාන්‍ය දැනීම ලකුණු 92.5) විසිනි. පොතේ විශිෂ්ඨත්වය ප්‍රායෝගිකව තහවුරු කර ඇත.**

(http://www.psc.cp.gov.lk/media/recruitment_teachers_2016_passed_list.pdf)

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ඇති ප්‍රතිපල ලේඛනයේ අනු අංක 703 බලන්න.)

*[මුද්‍රණ වියදම් නිසා පිටපත් සීමිතයි. ඔබේ පිටපත අදම ලබාගන්න. ]

## පොත මිලදී ගැනිම:

(1) මහජන බැංකු ගිණුමට රු. 800/=ක් තැන්පත් කරන්න.
ගිණුම් හිමියා – A.R. අමරසිංහ
ගිණුම් අංකය – 158-2-001-9-6596285

(2A) බැංකු රිසිට්පතෙහි photocopy එකක් ගෙන එහි ඔබේ නම, ලිපිනය පැහැදිලිව ලියා (ජංගම දුරකථන අංකයක් ද සඳහන් කරන්න) scan කර hi3334444@gmail.com වෙත email කරන්න. හෝ
(2B) ඔබේ දුරකථනයෙන් බැංකු රිසිට්පතෙහි අකුරු පෙනෙන සේ පැහැදිලිව ඡායරූප ගත හැකිනම්, ඡායාරූපයක් email කළ හැක. නම, ලිපිනය, දුරකථන අංකය ද email කරන්න.

* Email කිරිම අපහසු නම් facebook inbox (message) කරන්න.
https://web.facebook.com/TeachingGKEdu/

(3) ඔබේ email ය ලද පසු පොත ලියාපදිංචි තැපැලෙන් එවනු ලැබේ (දින 3ක් තුළ නිවසට ලැබේ).

(4) වැඩි විස්තර hi3334444@gmail.com මගින් හෝ 077-3521105 දුරකථනයෙන් විමසන්න.

*පොත මිලදී ගත් විට පහත සේවාවන් නොමිලයේ ලැබේ :-

1. වෘත්තීය විෂයයන් ජාතික හා පළාත් පාසල් 2017 හා බස්නාහිර පළාත් විත්‍ර 2017 ගුරු විභාග සඳහා සැකසු සාමාන්‍ය දැනීම ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු පත්‍රය (පොත සමඟ තැපැල් කරයි).
2. ඉලක්ක ප්‍රශ්න පත්‍ර 3 ක් email කරනු ලැබේ. (මාසිකව 1 බැගින්)
3. ඔබේ විභාගයට වැදගත් වන නවතම ගුරු අධ්‍යාපන කරුණු email කරනු ලැබේ. (මිල දී ගත් දින සිට මාස 6 ක් දක්වා)

**“ගුරු විභාග සාමාන්‍ය දැනීම 1000” පොත පරිශීලනය කළ ඔබට ගුරු විභාග සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රයට ඉතා හොඳින් මුහුණදිය හැකි බව නිසැකය.**

ඔබට විශිෂ්ඨ ජයක් පතමි !

**A.R. අමරසිංහ**